සිආදෙ/3/5/2 –I | චක්‍රලේඛ අංක 04/2015 (I)

සිවිල් පාලන අංශය,

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව,

බම්බලපිටිය.

2016.12.01

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,

සියලුම අධ්‍යක්ෂවරුන්/ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ සහකාර අධ්‍යක්ෂවරුන්, සියලුම අංශ භාර නිලධාරීන්,

සියලුම බලකා අණදෙන නිලධාරීන්/ පුහුණු කඳවුරු භාර අණදෙන නිලධාරීන්,

හා ව්‍යාපෘති භාර නිලධාරීන්

**<u>සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට නිවාඩු හිමිකම ලබාදීම</u>**

උක්ත මැයෙන් යුතුව මා විසින් 2015.06.09 දින නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 04/2015 හා බැඳේ.

02. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MOD/CIS/10/CSD/Leave හා 2016.11.24 දිනැති ලිපියේ අනුමැතිය ප්‍රකාරව උක්ත චක්‍රලේඛයේ 1.9 වගන්තිය ඉවත් කර, ඊට පහත සඳහන් වගන්ති එකතු කිරීමෙන් සංශෝධනය කරන බව මින් දන්වා සිටිමි.

03. ඒ අනුව,

"

1.9 සෑම මසකම ඉරිදා දිනයන් (සේවා අවශ්‍යතාවන්ට අනුව කැඳවීමට යටත්ව) සිවිල් ආරක්ෂක සාමාජිකාවන් (කාන්තා නිලධාරිනියන්) සඳහා පමණක් හිමි දින විවේක දිනය ලෙස ලබා දෙනු ලැබේ.

1.10 ඉරිදා දිනයේද සේවය කරනු ලබන සිවිල් ආරක්ෂක සාමාජිකාවන් (කාන්තා නිලධාරිනියන්) හට සහ සියලුම සිවිල් ආරක්ෂක සාමාජිකයන් (පිරිමි නිලධාරීන්) හට අඛණ්ඩව දින 09 ක් සේවය කිරීමෙන් පසු එක් දිනක් (01) දින විවේකය ලෙස හෝ අඛණ්ඩව දින 27 ක් සේවය කිරීමෙන් පසු විවේක දින 03 ක් ලෙස එකවර ලබා ගැනීමට හැක. "

04. 2016.12.01 දින සිට මෙම විධිවිධාන ක්‍රියාත්මක වන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
නො: 23, දුම්රියපොළ පාර,
බම්බලපිටිය, කොළඹ-04.

පිටපත් -:

1. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.